අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/01/වා.ස්.මා - 2025
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2026.01. 02

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්

**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම - 2025</u>**

මාගේ සමාංක හා 2025.12.02 දිනැති ලිපිය හා ඒ සමඟ ඉදිරිපත් කළ 2025 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල යෝජනා හා බැඳේ.

02. එම ස්ථාන මාරු මණ්ඩල යෝජනා සඳහා අභියාචනා කැඳවීම අනුව මා වෙත ඉදිරිපත් වූ අභියාචනා පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 254 සහ 255 වගන්ති අනුව වූ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ මේ සමඟ ඉදිරිපත් කරමි. මෙමඟින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත්ව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2025.12.02 දිනැති ලිපිය මඟින් යෝජිත 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි. **එම නියෝග අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ http:/www/moe.gov.lk වෙබ් අඩවියේ පළකර ඇත.**

03. ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් වන අභියාචනා :

(අ) ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති XX වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක. නිවැරදිව සම්පූර්ණ කරන ලද අභියාචනා හා එහි සඳහන් කරුණු සනාථ කිරීමට අදාළ ලියවිලි පරිලෝකනය කර 2026.01.19 වන දින මධ්‍යාහ්න 12.00ට පෙර atslps2025@gmail.com යන විද්‍යුත් තැපැල වෙත යොමු කරන මෙන් දන්වමි. එහි පිටපතක් Info@psc.gov.lk දරණ විද්‍යුත් තැපැල වෙත එම අවස්ථාවේදීම යොමු කරන ලෙසද අදාල විද්‍යුත් තැපැල් පනිවිඩයෙහි මාතෘකාව ලෙස ඔබගේ ස්ථාන මාරු ලැයිස්තුවෙහි අනුක්‍රමික අංකය සඳහන් කරන ලෙසද දන්වමි. ප්‍රමාද වී ලැබෙන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලබන බවද කාරුණිකව දන්වමි.

(ආ) සමාලෝචන කමිටුවට අභියාචනා ඉදිරිපත් කළ නිලධරයන්ට පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකි අතර එසේ නොවන අභියාචනා සලකා බලනු නොලැබේ.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම

**(අ) වාර්ෂික ස්ථාන මාරු නියෝග උක්ත සමාලෝචන කමිටු තීරණ යටතේ 2026.01.06 දින සිට ක්‍රියාත්මක විය යුතුය.**

(ආ) ඒ අනුව ඔබ පළාතෙහි/ කලාපයෙහි/විද්‍යාලයෙහි සේවය කරන ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරී භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි.

05. ඉහත 04(ආ) අනුව කටයුතු කිරීමෙන් පසු යම් නිලධරයෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරී සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති 257- V වගන්තිය අනුව සේවය හැරයෑමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

06. 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථානයට වාර්තා කරන නිලධාරීන් ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට සති 2ක් ඇතුළත එනම් 2026.01.19 **දිනට පෙර** මා වෙත වාර්තා කළ යුතුය.

07. වාර්ෂික ස්ථාන මාරු නියෝග සඳහා අවනත නොවන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 31.1.14 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවන බැවින් සම්බන්ධයෙන් අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

08. මෙම වාර්ෂික ස්ථාන මාරු හේතුවෙන් ප්‍රවාහන අපහසුතා හෝ වෙනත් යම් කරුණක් පදනම් කරගෙන ස්ථාන මාරු වීමට අකමැති නිලධාරීන් සිටීනම් ඔවුන්ට පහසු පළාත් පාසල් ලබා ගැනීම සඳහා දින 14 ක් ඇතුලත අදාල ආකෘති පත්‍රය මගින් පළාත් ස්ථාන මාරු සඳහා ඉල්ලීම් කළහැකි බවද කාරුණිකව දන්වමි. ( අදාළ ආකෘති පත්‍රය ඇමුණුම 1 මගින් දැක්වේ)

නාලක කලුවැව
ලේකම්